ශීර්ෂය 311 -ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) **පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් වාහන අලුත්වැඩියා සඳහා අවස්ථා 05 කදී වැය කර තිබූ එකතුව රු.795,000 ක පුනරාවර්ථන වියදම් වැය විෂය අංක 311-1-1-0-1301 යටතේ දැරිය යුතු වුවත්, එම වියදම මූලධන වැය විෂය අංක 311-1-1-0-2003 යටතේ වැය කර ගිණුම්ගත කර තිබුණි. එම නිසා පුනරාවර්තන වියදම් රු.795,000 ක් අඩුවෙන් සහ ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වසරකට වඩා කාලයක් පවතින අමතර කොටස් යෙදීම වන බැවින් 2003 ප්‍රාග්ධන වැය විෂයෙන් වියදම දරා ඇත. | බ්රේක් පෑඩ්, සොකට් සෝබර්, ක්ලච් ප්ලේට් යෙදීම ආදිය පුනරාවර්තන ස්වභාවයේ වියදම් බව නිශ්චිත වන බැවින් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් නිවරැදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු බව. |

(ආ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| i. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛණයේ 4 වගන්තිය අනුව 2018 න් පසු විශ්‍රාම හෝ මියගිය නිලධාරීන් ගෙන් අයවිය යුතු කිසිදු මුදලක් අත්තිකාරම් බී ගිණුමේ නොදැක්විය යුතු වුවත් විශ්‍රාමගිය නිලධාරීන් තුන්දෙනෙකුගෙන් සහ මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වූ එකතුව රු. 541,315 ක් අයකර නොගෙන අත්තිකාරම් බී ගිණුමේ දක්වා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| ii. | දෙපාර්තමේන්තුවේ සේවය හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 172,175 ක් සහ වැඩ තහනම් කල නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 183,840 ක් වසර 4ක් ගත වුවත් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | අයකර ගැනීම සඳහා අවශ්‍ය විධිමත් හා කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගත යුතු බව. |

ඇ) දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2022/05 හි 8.2 ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ දීර්සකාලීන භුක්තිය යටතේ ඇති ඉඩම් 08 ක් හා ගොඩනැගිලි 04 ක අයිතිය පවරා ගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මහියංගනය සංචාරක බංගලාව සහ ව්‍යාපෘති කාර්යාලය පිහිටි ඉඩමේ මිනින්දෝරු සැලැස්ම ලැබී ඇති බැවින් ඒවා තක්සේරු කිරීමට ඉල්ලීම් කර ඇත. අනෙකුත් ඉඩම් සදහා ප්‍රාදේශීය ලේකම්වරු වෙතින් මිනින්දෝරු සැලසුම් හා හිමිකම් ඔප්පු මෙතෙක් ලැබී නොමැති නිසා තක්සේරු වාර්තා ලබාගත නොහැකි වී ඇත. | මිනින්දෝරු වාර්තා හා හිමිකම් ඔප්පු ලබා ගෙන තක්සේරු සිදු කර ගිණුම් ගත කල යුතු බව. |
| (ii) | භාණ්ඩාගාර ලේකම්ගේ 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් කොම්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කලයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ස්ථාන 11 ක තිබෙන මූල්‍ය නොවන වත්කම් අයිතම 282 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී කමිටුවක් පත් කර අදාල භාණ්ඩ වල වටිනාකම තක්සේරු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුව විසින් සියළු වත්කම් ගිණුම් ගත කල යුතු වන අතර එම වත්කම් විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කළ යුතුවේ. |
| (iii) | දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දී මිලදී ගත් එකතුව රු.1,149,366 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර හා සවි කිරීම් 2 හා 2020/2021 වර්ෂවලදී රු.7,909,141 ක් වැය කර ඉදි කර තිබූ අනුරාධපුර ව්‍යාපෘති කාර්යාලයේ ගොඩනැගිලි වටිනාකම. මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී ගිණුම්ගත කර ඇත | මූල්‍ය නොවන වත්කම් මිලදී ගත් වර්ෂයේදී ගිණුම්ගත කිරීමට හා කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කල යුතු බව. |

(ඈ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ඨයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන පවතින තොරතුරු මත යාවත්කාලීන කර ඇත. | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි පරිදි දෙපාර්තමේන්තුව සතු වත්කම් තක්සේරු කර ගිණුම් ගතකර ස්ථාවර වත්කම් ලේඛණය නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීම් වෙනුවෙන් වසර 3 - වසර 5 අතර කාලයක සිට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දෙපාර්තමේන්තුවට අයවීමට තිබූ රු.343,800 ක හිග හිටි ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | ඉදිරි පියවර ගැනීමට කමිටුවක් පත් කර ඇත. | හිග මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය සියළු පියවර කළමනාකරණය විසින් ගත යුතු බව. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂය අංක 311-1-1-1-2506 යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කල රු.6,700,000 ක මුදලින් රු.3,805,648 ක් එනම් සියයට 57 ක්ම සංවර්ධනය කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගැනීම මෙම තත්වයට ඍජුවම හේතු වී තිබුණි. | රටේ පැවති ව්‍යාකූල තත්වය නිසා භෞතික සැලසුම් සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා ඉතිරි වීම් සිදු විය. තව ද ලෝලුගස්වැව ව්‍යාපාතිය සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. | ඉදිරි තත්වයන් පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යනයක් සිදු කර නිසි සැලැස්මකට අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කල යුතු බව. |

### 2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ( i ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ 03 හා 04 ඡේද | 1,310,732 | රාජකාරි ගමන් බිමන් යා යුත්තේ රජයට අඩුම වියදමක් වැය වන පරිදි වන අතර, එය ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර (පොදු 177) මඟින් පියවා ගත යුතු වුවත් එසේ නොකර දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා නවාතැන් හා ආහාර සඳහා දෙපාර්තමේන්තුව විසින් කිසිදු සීමාවකින් හා අනුමැතියකින් තොරව මුදල් වැයකර තිබුණි. | කලාපීය භෞතික සැලසුම් සකස් කරන නිලධාරීන්ට පමණක් ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර මගින් පියවා ගැනීමෙන් බැහැරව ප්‍රසම්පාදන පටිපාටියට අනුව කටයුතු කර නවාතැන් ආහාර ලබා දී ඇත. ඔවුන්ට ගමන් වියදම් ගෙවීම් කර නැත. | නීතිරීති ප්‍රකාරව කටයුතු කල යුතු අතර විශේෂිත තත්වයන් සඳහා වෙනම අනුමැතියන් ලබා ගත යුතු බව. |
| (ii) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ - කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4.3 වගන්තිය | 1,599,200 | රජයේ වාහන අලුත්වැඩියාවලදී ඉංජිනේරු සහතිකය ලබා ගෙන ගෙවීම් කල යුතු වුවත් අවස්ථා 14 ක දී සිදු කර තිබූ අලුත්වැඩියා වෙනුවෙන් එවැනි සහතිකයක් ලබා නො ගෙන ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු යොදා ගැනීමට සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. |

### 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත සහ මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගන්නා මාණ්ඩලික නිලධාරී විසින් තම කාර්යය නිමකර දින 10 ක් තුළ පියවිය යුතු වුවත් අවස්ථා 20 කදී එකතුව රු.857,470 ක් වටිනාකම් ඇති අතුරු අග්‍රිම දින 12-64 ත් අතර කාලයක් ප්‍රමාද වී නිරවුල් කර තිබුණි. | ඉදිරියේදී අතුරු අග්‍රිම දින 10 තුල පියවීමට කටයුතු කරන ලෙස නිලධාරින් දැනුවත්කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අතුරු අග්‍රිම දින 10 තුළ පියවෙන පරිදි ක්‍රියා මාර්ග හා පරිපාටි හඳුන්වා දීම කළමනාකරණයේ වගකීම වන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සුඛිත සුබල සුහුරු දැයක්, සුසැලි සුරැකි සොදුරු බිමක් වූ අතර මෙහෙවර වනුයේ ජාතික භෞතික සැළසුම් ප්‍රතිපත්තින්, සැළසුම් සහ උපාය මාර්ග සකස් කිරිම, සහ ශ්‍රී ලංකාවේ ගොඩබිම සහ එහි මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සාමාජීය පොදු හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීම හා ප්‍රවර්ධනය කිරීම කලාපීය හා ප්‍රාදේශීය සැලසුම මගින් එම ජාතික ප්‍රතිපත්තිය හා සැළසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම හා පාලනය කිරීම වේ. එසේ වුවද එම මෙහෙවරෙන් බැහැරව පූජාභූමි පිරිසිදු කිරීම හා වෙනත් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සේවකයින් 64 දෙනෙකු අඛණ්ඩව යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් වැටුප් හා අතිකාල වශයෙන් රු.25,349,196 ක් සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වැයකර තිබුණි. මේ සඳහා නගර හා ග්‍රාම නිර්මාණ පනතේ ප්‍රතිපාදන නොමැති බව නිරීක්ෂණය විය. | මෙම කාර්යමණ්ඩලය බුද්ධ ශාසන අමාත්‍යාංශයට අනුයුක්ත කරන මෙන් ඉල්ලීමක් එම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල ද එය ප්‍රතික්ෂේප කරන ලදී. මේ පිළිබඳව නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් හා බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට සංවිධානය කර ඇත. | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු කෙරෙහි අවධානය යොමුකර අදාළ විෂය පථය තුළ එම අරමුණු ලගාකර ගැනීමට හැකිවන පරිදි සුදුසු පවත්නා සම්පත් කාර්යක්ෂමව ඵලදායීව හා ආර්ථිකම වන ලෙස භාවිතා කළ යුතු බව. |

### 3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තින් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කළ යුතු වේ. 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021ඔක්තෝම්බර් 31 වන විට, 2019 වර්ෂයේදී සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්මේ | 2022 ජනවාරි ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්මේ සංශෝධනයන් සකස් කර අවසන් කර ඇත. අන්තර් අමාත්‍ය සම්බන්ධීකරණ කමිටු නිර්දේශ ද ලබා ගෙන ඇත. ජනාධිපති ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කිරීමට දිනයක් ඉල්ලා ඇත. 2023 මැයි 29 වන විටත් දිනයක් ලැබී නොමැත. | පනතේ 07 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලැස්ම පාර්ලිමේන්තු අමාත්‍ය මණ්ඩලයෙන්ද අනුමත කර ගත යුතු අතර රට තුල සිදු කෙරෙන භෞතික නිර්මාණ ඊට අනුකූලව සිදු කල යුතු වේ. එසේ නොවන අවස්ථා වලදී දෙපාර්තමේන්තුව ඒ බව ප්‍රකාශයට පත් කල යුතු වේ. |

| | | |
|---|---|---|
| අවශ්‍ය සංශෝධනයන් සිදු කල යුතු වුවත් එම කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. 2019 වර්ෂයෙන් පසු එනම් 2020 සිට 2022 වර්ෂය අවසානය දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුව මේ වෙනුවෙන් රු.529,351,900 මුදලක් වැය කර තිබූ නමුත් ජාතික භෞතික සැලැස්මේ අවශ්‍ය සංශෝධනයන් සිදු කර අනුමත කර ගෙන නොතිබුණි. | | . |
| (ආ) අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉන් ඉවත් කිරීම දෙපාර්තමේන්තුවට අයත් කාර්යභාරයක් නොවුව ද කැබිනට් තීරණයකට අනුව එම කාර්යය සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. ඒ අනුව 2016 ආරම්භ කර 2022 දක්වා කාලය සඳහා රු.මිලියන 634.7 ප්‍රතිපාදන සලසා දී තිබුණි. එසේ වුවද 2022 වර්ෂය දක්වා එයින් රු.මිලියන 13.4 ක් එනම්, සියයට 2 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. තව ද අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට නොහැකි වීම මත නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා රු.මිලියන 11.4 ක් වැය කර උපදේශක සේවාවක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. අනුරාධපුර පූජා භූමි පිරිසිදු කිරීම් ආදී කටයුතු වල යෙදී සිටින දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම ව්‍යාපෘති කාර්යාලයේ පදිංචි වී සිටින අතර ඔවුන්ට වැටුප් ලෙස වාර්ෂිකව රු.මිලියන 3.3 වැය කර තිබුණි. මේ අනුව වසර 06 ක් ගත වුව ද මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කාර්යය සිදු කිරීමට නොහැකි වී තිබුණි. | ලෝලුගස් වැව ඉඩම දෙපාර්තුමේන්තුවට 2021 ජූනි පවරාගෙන ඇත. ඉඩම් අමාත්‍යාංශය විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ඉල්ලා ඇත. එය සකස් කිරීමට උපදේශකයින් පත් කිරීමට කටයුතු සිදු කෙරේ. තවද පූජා භූමි සංවර්ධන කටයුතු කරන ලෙස නිලධාරින් මෙම කාර්යාලය භාවිතා කරයි. | තම විෂය පථයට අයත් නොවන කටයුතු පිළිබඳ වගකීම් පවරා ගැනීම පිළිබඳව කළමනාකරණය වගකිව යුතු වන අතර මෙම අදාළ නොවන කාර්යයන් සඳහා සම්පත් යෙදවීමෙන් තම ව්‍යවස්ථාපිත පරිදි ආයතනයේ විෂය පථයට අයත් ජාතික වැදගත්කමක් සහිත කාර්යයන් ඉටුකිරීම ප්‍රමාද වන බව හෝ මග හැරෙන බව නිරීක්ෂණය වේ.මේ නිසා තම විෂය පථයට අදාළ කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය විසින් කටයුතු කල යුතු බව. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ සේවා මධ්‍යස්ථාන (කුඩා නගර) සංවර්ධන සැලසුම යටතේ පළාත් 08 ක කුඩා නගර 21 ක භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2022 වර්ෂය අවසාන වන විට ඒ කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණි.කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබුණි. මේ හේතුවෙන් මෙම නගර 21 තුල නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් සැලසුමකින් තොරව ඉදිකර තිබීම පාරිසරික ගැටළු ඇති වීමට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය භෞතික සැලසුම් 20 ක් සකස් කිරීමට සැලසුම් කල ද කොරෝනා වසංගත තත්ත්වය එයට විශාල බාධාවක් විය. එබැවින් ප්‍රධාන කාර්යාලයට ආසන්න මධ්‍යස්ථාන 8 ක් සඳහා සැලසුම් සකස් කිරීමට තීරණය කරන ලදී. | සැලසුම් කල පරිදි භෞතික සැලසුම් සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |

**3.4 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1,2,3 වගන්ති ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන කමිටු රැස්වීමක්ම කාලසටහනකට අනුව සිදුවිය යුතු අතර රැස්වූ බවට පැමිණීමේ ලේඛනයක් සහ රැස්වීම් වාර්තා නිශ්චිත ආකෘතිය ප්‍රකාරව ද පවත්වා ගත යුතු වුවත් දෙපාර්තමේන්තුව එලෙස කටයුතු කර නොතිබුණි. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1.2.3 අනුව, ප්‍රසම්පාදන කාල සටහන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණ ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කමිටු රැස්වීම් පිළිබඳ වාර්තා තබා ගැනීමට කටයුතු කල යුතු බව. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කලයුතු වුවත්, එලෙස ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට සකස් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කල යුතු බව. |
| (ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යුත් රජයේ ප්‍රසම්පාදන පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා ප්‍රසම්පාදන ආයතන ලියාපදිංචි කිරීම, සම්බන්ධතා නිලධාරියෙකු ලියාපදිංචි කිරීම (L0S), විකුණුම්කරුවන් ලියාපදිංචි කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, | 2023 වර්ෂයේ දී ලියාපදිංචි වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හා සම්බන්ධව කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන දැන්වීම ප්‍රකාශයට පත් කිරීම හා වෙළඳපල සැදහුම් ක්‍රමය (shopping , method) සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම සිදු කල යුතු වුවත්,දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුලදී එලෙස කටයුතු කර නොතිබුණි. | | |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ලබා දී තිබූ තක්සේරු වටිනාකම රු.5,000,000 ක් වූ හෙක්ටයාර 0.0506 ක ඉඩමක් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදා නොගෙන වසර 13 ක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි. | අයවැය චක්‍රෙල්ඛ අංක 02/2023 යටතේ අත්‍යාවශ්‍යම රාජ්‍ය සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පමණක් මුදල් ප්‍රතිපාදන භාවිත කල යුතු බවට ගෙන ඇති තීරණය අනුව සංවර්ධන කටයුත්තක් සඳහා ප්‍රතිපාදන ඉල්ලීමට නොහැකි විය. | පවරා ගන්නා ලද ඉඩම් අපේක්ෂිත කාර්යයන් සඳහා යෙදවීමට නොහැකි නම් වෙනත් ප්‍රමුඛ කටයුතු සඳහා යොදා ගැනීමට ආපසු පවරා දිය යුතු බව. |

**3.6 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංචාරක බංගලා සහ විශ්‍රාම ශාලා 05 ක් තුලින් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබූ ආදායම රු.870,250 ක් වුව ද ඒවාට අනුයුක්ත කාර්යමණ්ඩලය 12 ක් වූ අතර ඔවුන්ගේ වැටුප් සහ අතිකාල සඳහා රු.27,460,762 ක් ගෙවා තිබුණි. ඒ අනුව සංචාරක බංගලා පවත්වාගෙන යාමෙන් අලාභ ලබා තිබූ නමුත් එම බංගලා ලාභදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කර නොතිබුණි. | 2021 කොවිඩ් සහ 2022 රට තුළ පැවති ඉන්ධන අර්බුදය නිසා සංචාරකයන් පැමිණීම අඩු විය. | ආදායම් වැඩි කර ගැනීමට සහ වියදම් පාලනයට කටයුතු කළ යුතු බව. |
| (ආ) මූලධන වැය විෂයය අංක 311-1-1-0-02-2506 යටතේ යටිතල පහසුකම් සංවර්ධනයට වෙන්කල රු.6,700,000 ක මුදලින් රු. 3,805,648 ක් එනම් සියයට 57 ක්ම සංවර්ධන කටයුතු සඳහා වැය නොකර වර්ෂ අවසානයේ ඉතිරි කර තිබුණි. | ලෝලුගස්වැව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | වෙන් කර ගන්නා ලද ප්‍රතිපාදන වැය කර අදාළ අරමුණු නියමිත දිනවලදී ඉටු කර ගැනීමට කටයුතු කල යුතු බව. |

**04.** **තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 02/2017 චක්‍රලේඛය ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම, ආයතනයේ කාර්ය භාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීම, තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධීකරණය පිළිබඳ නිලධාරීන් හඳුනා ගැනීම සිදු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක. 02/2017 චක්‍රලේඛය අනුව, නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශක ප්‍රකාශයට පත්කිරීම හා ආයතනයේ කාර්යභාරයය හඳුනා ගැනීම මේ වනවිට නිමකර ඇති අතර, සබැඳි පාර්ශව හඳුනා ගැනීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

**05.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 289 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 178 ක් වූයෙන් පුරප්පාඩු 111 ක් විය. මේ අතර දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කිරීම කෙරෙහි බලපාන අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 30 ක් විය. | 2022.09.02 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2022 අනුව ඒකාබද්ධ අරමුදලින් වැටුප් ගෙවන තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාද කිරීම සිදුවී ඇත. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |